# දේව දූතයා මංගලම් කී
## මංගලෝත්සවය

### පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 7:10–14

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"කන්‍යාවක් ගැබ්දරා පුත්‍රයෙකු බිහි කරන්නීය."

සමිඳාණන් වහන්සේ ආහාස්ට තවත් පණිවුඩයක් යවමින්, "නුඹට ලකුණක් දෙන ලෙස නුඹේ දෙවි සමිඳාණන් වහන්සේගෙන් ඉල්ලන්න: ගැඹුරු පාතාලයෙන් හෝ ඉහළ අහසෙන් හෝ එය පැමිණෙන ලෙස ඉල්ලන්නැ"යි වදාළ සේක.

එහෙත්, ආහාස් උත්තර දෙමින්, "මම නොඉල්ලමි: සමිඳාණන් වහන්සේ පරීක්ෂා නොකරමි"යි කී ය. එවිට යෙසායා මෙසේ පිළිතුරු දුන්නේ ය: "එම්බා දාවිත්ගේ වංශය, දැන් සවන් දෙන්න: නුඹලා මාගේ දෙවියන් වහන්සේගේ ඉවසීම වෙහෙසන්නේ, නුඹලා මනුෂ්‍යයන්ගේ ඉවසීම වෙහෙසනවා මදිවට ද? සමිඳාණන් වහන්සේ ම නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න, කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයෙකු බිහි කරන්නී ය: එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය.

*දේව වචනය මෙසේ ය.*

### පිළිතුරු ගීය ගීතාවලිය 40:6–10

පිළිතුර: මාගේ දෙවියනි, මෙන්න, මම ඔබේ කැමත්තට ප්‍රිය වෙමි.

ගීය : ඔබ පුද පඬුරට ප්‍රසන්න නැත.
දවන යාග පූජා හා පාප පූජාවලින් ඔබට වැඩක් නැත:
ඒ වෙනුවට ඔබ වදන් අසන පිණිස මාගේ දෙසවන දුන් සේක.
එවිට මම, "මෙන්න, මම මෙහි ය"යි කීවෙමි.

"මා පිළිබඳ අණ පණත් ඔබේ ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත.
මාගේ දෙවියනි, ඔබේ කැමැත්තට ප්‍රිය වෙමි,
ඔබේ නීති මසිතෙහි නිදන් කරගතිමි."
සමිඳුනි, ඔබට වඳින පිරිස් මැද,
ඔබේ ගැළැවීමේ ක්‍රියා වර්ණනා කෙළෙමි.

නොනවත්වා එය තවත් වර්ණනා කරන බව ඔබ දන්න සේක.
ඔබ දෙන ගැළවීම සිතෙහි රඳවා නිකම් නොසිටියෙමි:
ඔබේ ගැළැවීම හා විශ්වාසවන්තකම ප්‍රකාශ කෙළෙමි.
මහ පිරිස් මැද ඔබේ කරුණාව ද විශ්වාසවන්තකම ද
නොවළහා දන්වා සිටියෙමි.

## දෙවන දේව ප්‍රකාශනය හෙබ්‍රෙව් 10:4–10

*හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"දෙවිඳුනි, මෙන්න, පොත් වෙළුමේ මා ගැන ලියා ඇති සේ ඔබේ කැමැත්ත ඉටු කිරීමට මම පැමිණියෙමි."

ගොනුන්ගේත් එළුවන්ගේත් ලෙයින් පව් පහ කර දැමීමක් සිදු නොවේ. එහෙයින්, ක්‍රිස්තුන් වහන්සේ ලෝකයට වඩින කල දෙවියන් වහන්සේට මෙසේ වදාළ සේක: "ඔබට පුද පඬුරු රිසි නැත. එහෙත් ඔබ මට සිරුරක් සූදානම් කළ සේක: දවන පූජා හා පාප පූජා කිසිත් ඔබ සිත් නොගනියි, එසේ හෙයින්: දෙවිඳුනි, පොත් වෙළුමේ මා ගැන ලියා ඇති සේ, ඔබ රිසි දේ කරනු වස් මෙන්න, මම ඇවිත් සිටිමි". ව්‍යවස්ථාව අනුව ඔප්පු කරන පුද පඬුරුවලටත්, දවන පූජාවලටත්, පාප පූජාවලටත්, ඔබ කැමති වන්නේ වත් සතුටු වන්නේ වත් නැතැ යි ඉහත කියා: "මෙන්න, ඔබගේ කැමැත්ත කරන්නට මම පැමිණ සිටිමි"යි උන් වහන්සේ දෙවනු ව වදාළ සේක. උන් වහන්සේ දෙවැන්න පිහිටුවන පිණිස පළමුවැන්න අවලංගු කරන සේක. ඒ කැමැත්ත පරිදි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය සඳහට ම එක වරක් පූජා කිරීමෙන් අපි පාරිශුද්ධිය ලැබ සිටිමු.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ජොහන් 1:14

ආලේලූයා! ආලේලූයා!
ධර්මයාණෝ මාංසගතව
අප සමඟ වැඩ විසූ සේක.
අපි උන් වහන්සේගේ තේජශ්‍රීය දුටිමු.
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 1:26–38

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### "ඔහු පිළිසිඳ පුතෙකු ලබන්නීය"

සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝසෙප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදි. ඒ කන්‍යාවගේ නම මරියා ය. දේව දූතයා ඇ සිටි තැනට පැමිණ, "විපුල ප්‍රසාදලත් උත්තමිය, ඔබට මංගල වේ: සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය"යි කී ය. එහෙත්, ඇ ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැ යි සිත සිතා සිටියා ය. දේව දූතයා ඇට කතා කොට, "මරියාණෙනි, බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය: උන් වහන්සේට 'ජේසුස්' යන නාමය තබන්න. උන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක, පරමොත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක: උන් වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන් වහන්සේට ප්‍රදානය කරන සේක: උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක: උන් වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේය"යි කී ය. එවිට මරිය තුමී දේව දූතයාට කතා කොට, "මට පුරුෂයකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකි දැ"යි ඇසුවා ය. දේව දූතයා ඇ ට උත්තර දෙමින්, "ශුද්ධාත්මයාණන්

වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසා ගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතෙකු පිළිසිඳ ගත්තා ය. වඳ යයි කී ඇයට දැන් සවැනි මාසය ය. මක්නිසා ද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ”යි කීවේ ය. මරිය තුමී කතා කරමින්, “බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි: ඔබ පැවසූ ලෙසම මට ඉටු වේ වා”යි කීවා ය. එවිට දේව දූතයා ඈ කෙරෙන් වෙන් ව ගියේ ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.